හතුරුසිංහ, එස්.
PAPER

බෞද්ධාගමික ස්මාරක විෂයයහෙි ශ්‍රී ලංකාවේ අනුගමනය කෙරෙන සංරක්ෂණ ප්‍රතිපත්ති

එස්.හතුරුසිංහ, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්මාරක විශාල ප්‍රමාණයක් ඇති රටකි මේ ස්මාරක අනාගත පරම්පරාව වෙනුවෙන් ආරක්ෂාකර තැබීමේ ප්‍රධාන ක්‍රමවේදය වන්නේ සංරක්ෂණ ක්‍රියාවලියට භාජනය කිරීමයි නමුත් ලෝකයේ අනෙකුත් රටවල ස්මාරක සංරක්ෂණය කිරීම මෙන් නොව ශ්‍රී ලංකාවේ එම ක්‍රියාවලිය සිදු කිරීමේදී ප්‍රායෝගිකව මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් ඇති එනම් ජීවමාන ආගමක් වූ බෞද්ධගමට අයත් ස්මාරක සංරක්ෂණයේ දී සංරක්ෂකයා මුහුණ දෙන ගැටළුවයි සිය අධ්‍යාත්මයේ වන්දනීය ස්ථාන නටඹුන් වශයෙන් පවතිනවාට වඩා ඒවා ආගමික ශ්‍රද්ධාව හා හැඟීම් දනවන ස්ථානයන් ලෙෂ දකීමට බෞද්ධයන් තුළ පවතින කැමත්ත මේ තත්ත්වය ඇතිවීමට හේතුවී තිබේ ශ්‍රී ලංකාවේ පවතින පැරණි ස්මාරකවලින් වැඩි ප්‍රමාණයක් මේ බෞද්ධාගමට අයත්වීම නිසාම මේ ගැටළුව මඟහැර යාමට හෝ නොසලකා සිටීමට සංරක්ෂකයාට නොහැකිවී තිබේ එබැවින් සංරක්ෂණ ක්‍රියාවලියේදී ආගමික වැදගත්කමට හානියක් නොවන ආකාරයෙන් හා එහි පෞරාණිකත්වය ආරක්ෂාකර ගනිමින්෴ ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂිත සංරක්ෂණ ප්‍රතිපත්තීන් සකස්වී ඇති ආකාරය හා ඒවා ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වියි